# අධ්‍යක්ෂ තනතුර

## තාක්ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය.

මොරටුව විශ්ව විද්‍යාලයීය තාක්ෂණික ආයතනයේ අධ්‍යක්ෂ තනතුර පිරවීම සඳහා, **01.01.2024** දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2024 අනුව අයදුම්පත් කැඳවනු ලැබේ.

විශ්වවිද්‍යාල පද්ධතියේ හෝ ඉන් පරිබාහිරව සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් මේ සඳහා අයදුම්කිරීමට සුදුසුකම් ලබන අතර, අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන විට වයස අවුරුදු 63 ට අඩු විය යුතුය.

ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හා සමාන තාක්ෂණික පාඨමාලාවන් පැවැත්වීම සඳහා වර්ෂ **2000 මාර්තු 07** වන දිනැති නියමය මගින් පිහිටවනු ලැබූ මෙම ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතනයකි.

2000 අංක 03 දරන, මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතන, නියමාවලිය අනුව, අධ්‍යක්ෂකවරයා ආයතනයේ පූර්ණකාලීන නිලධාරියෙක් වන අතර, ප්‍රධාන විධායක නිලධාරියා, ශාස්ත්‍රීය නිලධාරියා සහ ගණන් දීමේ නිලධාරියා ද වේ. නිල බලයෙන් ආයතනයේ කළමනාකාර මණ්ඩලයේ සාමාජිකයෙක් හා අධ්‍යයන මණ්ඩලයේ සභාපතිවරයා ද වේ. අධ්‍යයන හා පරිපාලන කටයුතු මෙහෙයවීම, කළමනාකරණ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම හා ආයතනයේ විනය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අධ්‍යක්ෂකවරයා වගකිව යුතු වන අතර, අදාළ අමාත්‍යාංශ, විශ්වවිද්‍යාල, විද්‍යායතන හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම සමග මනා සම්බන්ධතාවයකින් යුක්තව කටයුතු කළ යුතු වේ. තනතුරේ ධූර කාලය, අවුරුදු 03 ක් හෝ වයස අවුරුදු 65 සම්පූර්ණ වන තෙක් යන අවස්ථා දෙකෙන් කලින් එළඹෙන දිනය තෙක් වේ.

**වැටුප් පරිමාණය :U-AC 5 (II) Rs. 198,280 - 13x4,850 - 261,330.p.m.**

කාර්යාලයීය ප්‍රවාහන පහසුකම්, සංග්‍රහ දීමනා, විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදල (15% සේවායෝජකයා සහ 10% සේවාදායකයා), සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල (3% සේවා යෝජකයා). ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරක් දරන්නෙක් මේ සඳහා පත් කරනු ලැබුව හොත් ඔහු/ඇය ලබමින් සිටි වැටුප ලබාදෙන අතර අධ්‍යක්ෂ තනතුරට හිමි අනෙකුත් දීමනා ද ලබා දෙනු ඇත. පහත දැක්වෙන ලේඛන සමග අයදුම්පත ඉදිරිපත් කළ යුතු වේ.

1. උපන් දිනය ද සහිතව අයදුම්කරුගේ සම්පූර්ණ ජීව දත්ත තොරතුරු පත (සහතික කරන ලද උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)
2. ආයතනයේ සංවර්ධනය සඳහා වන දැක්ම හා තනතුරට තෝරාගනු ලැබුවහොත් අයදුම්කරු විසින් ආයතනයේ සංවර්ධනයට ඉටුකිරීමට බලාපොරොත්තු වන කරුණු පිළිබඳ වාර්තාවක්
3. දැනට එම තනතුර දරන අධ්‍යක්ෂවරයා අයදුම්කරුවෙකු වන්නේ නම් හෝ මීට පෙර ආයතනයේ අධ්‍යක්ෂ ධූරය දරා ඇත්නම්, ඔහු/ඇයගේ පළමු ධූර කාලය තුළ ඉටු කරනු ලැබූ කර්තව්‍ය පිළිබඳ විස්තර කෙරෙන වාර්තාවක්.
4. අයදුම්කරු රාජ්‍ය අංශයේ, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ උසස් අධ්‍යාපන ආයතනවල සේවය කරන්නෙකු නම්, අදාළ තනතුරට තොරාගනු ලැබුවහොත් ඔහු /ඇය සේවයෙන් මුදා හැරිය හැකිද යන්න පිළිබඳව සේවා යෝජකයාගෙන් ලිපියක්.

**2024.01.01** දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 01/2024 දරන චක්‍රලේඛයේ උපදෙස් වලට අනුකූලව තෝරා ගැනීමේ ක්‍රියාවලිය සිදු කරනු ලබයි.

අයදුම්පත් **2026.09.10** දින හෝ ඊට පෙර ලැබෙන සේ **"නියෝජ්‍ය ලේඛකාධිකාරී, තාක්ෂණ ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය, දියගම, හෝමාගම"** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු අතර, ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"අධ්‍යක්ෂ තනතුර"** ලෙස සඳහන් කළ යුතුය.

රාජ්‍ය, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවය කරන පුද්ගලයන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් හරහා ඉදිරිපත් කළ යුතුය. මීට අමතරව, ඉහත ලේඛනවල මෘදු පිටපතක් සහ වෙනත් අදාළ ලේඛන PDF ආකෘතියෙන් hr@itum.mrt.ac.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කළ යුතු වේ. අමතර තොරතුරු සඳහා https://itum.mrt.ac.lk වෙබ් අඩවිය පරිශීලනය කළ හැකිය.

**නියෝජ්‍ය ලේඛකාධිකාරී/ලේකම්, කළමනාකරණ මණ්ඩලය,**
**තාක්ෂණික ආයතනය,**
**මොරටුව විශ්වවිද්‍යාලය, දියගම, හෝමාගම.**
**2026.08.09**